"රත්නපුර දිස්ත්‍රික්කයේ පරිසරය ආශ්‍රිත මැණික් කර්මාන්තය,

පාසල් ළමුන්ගේ විධිමත් අධ්‍යාපනය කෙරේ දක්වන බලපෑම"

පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් - රත්නපුර

දිස්ත්‍රික්කයේ පාසල් ඇසුරින්.

කොළඹ විශ්වවිද්‍යාලයේ

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා

ඉදිරිපත් කරන නිබන්ධනය

UCLIB

403436

අධ්‍යාපන පීඨය

ඩී. ආනන්ද ජයවර්ධන (M.Phil 57)

අධ්‍යාපනවේදී උපාධිය (දෙවන පෙළ)

දිනය:- 1984-07-01

CR

UNIVERSITY OF COLOMBO - SRI LANKA

## සංක්ෂේපයෙන් ......

විධිමත් අධ්‍යාපනය කෙරේ මැණික් කර්මාන්තයේ බලපෑම පිළිබඳව කරන ලද මෙම අධ්‍යයනය කාලීන වැදගත්කමක් උසුලන සමාජ විද්‍යාත්මක සජීවී ගැටළුවකි. ඉපැරණි සංස්කෘතියකින් හෙබි මැණික් කර්මාන්තය එයටම ආවේණික වූ සාම්ප්‍රදායික තාක්ෂණවේදයකට හිමිකම් කියන අතර, නවීන තාක්ෂණවේදයන්ද සංකලනය වී පවතී. තාක්ෂණිකවේදයන්ට විධිමත් අධ්‍යාපන පද්ධතිය තුළ, ප්‍රමුඛ-ත්වයක් ලබා ගැනීමට උත්සාහ කෙරෙන මෙවන් අවධියක, රත්න විද්‍යාව පාසල්වල වෘත්තියමය විෂයක් හෝ තාක්ෂණික විෂයක් ලෙසද (1982 ධවල පත්‍රිකා වට අනුව) යොදාගත හැකි වන්නේය. රත්න විද්‍යාව විධිමත් අයුරින් පාසල්වල ප්‍රගුණ කරන්නේ නම් විරැකියාවටද එය පිළියමක් විය හැකිය.

මිනිස් වර්ගයාගේ පැවැත්ම රඳී පැවති ප්‍රධාන සාධකයක් වන අධ්‍යාපන ක්‍රියාවලිය වර්තමානයේ සමාජ දියුණුවත් සමගම පුළුල් ක්‍රියාදාමයක් වී ඇති බැවින්, විවිධ අයුරින් අධ්‍යාපනය නිර්වචනය වී තිබේ. ආයතනීකෘත අධ්‍යාපනය තුළින්, දුර්වලතා රැසක් එළිදැක්ම නිසා, විධිමත් අධ්‍යාපනයටද, අකාර්යක්ෂම හා අවැඩදායක යැයි විවේචන එල්ල වී ඇත. අධ්‍යාපනයටද අනෙක් සියළුම දෙයට මෙන් මානව වර්ගයා ජීවත්වන සමාජ - ආර්ථික - භෞතික හා සංස්කෘතික පරිසරයන් බලපෑම් කරයි. ඉතා ක්‍රියාශීලී පාරිසරික සාධකය ලෙස ආර්ථික සාධක පෙරමුණ ගන්නා අතර, මැණික් කර්මාන්තය ඇසුරින් එය විමසා බැලීමට මෙම අධ්‍යයනය උත්සාහ කරයි.

මෙම ක්ෂේත්‍රය සම්බන්ධව කෙරී ඇති ලෝක පර්යේෂණ ඉතා දුලබය. ඇමෙරිකාවේ ප්‍රාන්ත රාජ්‍යවල කපු වගා කරන ප්‍රදේශ ඇසුරින් කර ඇති පර්යේෂණ වලින් ද, පෙනියන්නේ කපු වගාව සම්බන්ධ කෘෂිකාර්මික පරිසරය විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය හා දෙමාපිය ආකල්ප කෙරේ බලපා ඇති බවයි.

මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ඉතාමත් ඉපැරණි ජාත්‍යන්තර ව්‍යාපාරයක් බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. මේ නිසාම මේ හා සම්බන්ධ සංස්කෘතියක් හා තාක්ෂණවේදයක් ද බිහිවී ඇත. රත්නපුර දිස්ත්‍රික්කය ශිලා යුගය පිළිබඳ ලංකාවේ ඉපැරණිම ස්ථානය වේ. රත්නපුර දිස්ත්‍රික්කයේ භූ ව්‍යුහය අනුව එය අතීතයේ වීල් වශයෙන් පැවති ඇත.

මැණික් යනු රසායනික විශේදනයන්ට ලක්වූ ඛනිජ විශේෂයකි. දුලබතාවය හා දෘඪතාවය නිසා මැණික්වල වටිනාකම ඉහළ යාමට හේතුවී ඇත. දියමන්ති හා රන් ආදියට ද වඩා මැණික්වල මිළෙහි ස්ථාවරත්වය තවදුරටත් ආරක්ෂා වී ඇත. එහෙත් ශ්‍රී ලංකාවෙන් ලැබෙන මැණික්වලින් 70% ක් පමණ විදේශගත වන්නේ නීත්‍යානුකූල නොවන මාර්ගවලින් බැවින්, රට සංවර්ධනයටද එය බාධකයක් වී ඇත.

පසුගිය දශකය තුළ මැණික් කර්මාන්තය, ශීඝ්‍රයෙන් හා නව මුහුණුවරකින් වර්ධනය වී ඇති නිසා රත්නපුර දිස්ත්‍රික්කයේ විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියෙහි නිරතවන්නන්ද මැණික් ව්‍යාපාරවල නිරත වී ඇත. අඩු ශ්‍රම තැපකිරීම, ඉතා සුළු කලකින් විශාල මුදලක් ලබාගත හැකිවීම යන සාධක දෙක මෙහිදී තදින් බලපා තිබේ. මෙහි ආකර්ෂණීයත්වය නිසා ගුරු – දෙගුරු හා ශිෂ්‍ය යන අංශයන්හි ආකල්පවල පවා වෙනස්කම් සිද්ධවී ඇත. මේ අයුරින් විධිමත් අධ්‍යාපන පද්ධතිය කෙරේ මැණික් කර්මාන්තයෙන් සිදුවී ඇති බලපෑම සොයා බැලීම මෙම අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු වෙයි.

රත්නපුර අධ්‍යාපන දිස්ත්‍රිකය ඉතා විශාල නිසා සංකීර්ණ ගැටළු රාශියක්ද මතු වී තිබේ. පාසල්වලට ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව පහළ මට්ටමක පැවතීම, පාසල් හැරයාම, අසමත්වීම, පාසල් උපකරණ හිඟය ආදිය මෙහිදී ප්‍රමුඛතාවයන් ගෙන තිබේ.

මෙම අධ්‍යයන නියැදිය සඳහා නාගරික පාසල් 10 ක් හා ග්‍රාමීය පාසල් 10ක් අහඹු ලෙස තෝරාගන්නා ලදී. නියැදිය සමග සාකච්ඡා කිරීමෙන් හා ප්‍රශ්නාවලි මගින් රැස්කරගන්නා ලද දත්ත ඇසුරින්, දිස්ත්‍රික්කයේ පවුල්වලින් වැඩි සංඛ්‍යාවක් මැණික් කර්මාන්තය වෘත්තිය වශයෙන් තෝරාගෙන ඇති බව පැහැදිලි විය. වෙනත් රැකියා කරන අය පවා අමතර රැකියාවක් ලෙස මැණික් කර්මාන්තය තෝරාගෙන තිබේ. සිසුන් මැණික් කර්මාන්තය කෙරේ පොළඹවනු ලබන්නේ පවුලේ උදවිය මැණික් කර්මාන්තයේ යෙදීමත්, සිසුන් ජීවත්වන පරිසරයේ වැඩිදෙනෙකු මැණික් කර්මාන්තයේ යෙදීමත්, ගුරු - දෙගුරු ක්‍රියාකාරීත්වය හා ආර්ථික අපහසුතාවයන් නිසාය. පාසල් සිසුන්ගෙන් 50% කට අධික සංඛ්‍යාවක් මැණික් කර්මාන්තයේ යෙදෙන බව පැහැදිලි විය. මේ සඳහා අවශ්‍ය දැනුම, කුසලතා, ආදිය සාම්ප්‍රදායික ක්‍රම මගින් (සමාජ පරිසරයෙන්) ලබා ඇත. මැණික් කර්මාන්තය නිසා විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය කෙරේ මතු වී තිබෙන ප්‍රධාන ගැටළුව වන්නේ සමාජ බලපෑමේ නව මුහුණුවර, විධිමත් අධ්‍යාපනය පිළිබඳ ඍණ ආකල්ප ඇතිවීම, වෙනත් ගුරු සිසු ගැටළු පැන නැගීම ආදියයි. පාසල් බාහිර කටයුතු සඳහා වුවද මැණික් කර්මාන්තකරුවන්ගෙන් ලැබෙන ආධාර ප්‍රමාණවත් නොවේ.

නොයෙකුත් ආකර්ෂණීය සාධක නිසා සිසුන් මැණික් කර්මාන්තය කෙරේ නැඹුරු වී ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ ගුරු භවතුන්ගේත ක්‍රියාවලියද සිසුන් මේ සඳහා පොළඹවන්නක් වී තිබේ. නවීන තාක්ෂණවේදය හා සාම්ප්‍රදායික ක්‍රම මගින් සිසුන් මැණික් කර්මාන්තය පිළිබඳ දැනීම ලබා ඇත. සිසුහු පාසල් කාලයෙන් පසුව හා පාසල් කාලය තුළදී මැණික් අලෙවිකරණය, මැණික් කැපීම හා ඔප දැමීම, මැණික් ගැරීම, ආදිය මගින් මැණික් කර්මාන්තයේ යෙදෙති. අසංවිධිත අධ්‍යාපන වැඩසටහන් මගින් ද මොවුහු මැණික් කර්මාන්තය පිළිබඳ දැනීම හා කුසලතා ලබා ගනිති. රත්න විද්‍යාව පාසල් විෂයක් කිරීම පිළිබඳව ගුරු සිසු දෙපක්ෂය හා දෙමාපියන් කැමැත්ත දක්වා තිබේ. මැණික් කර්මාන්තයේ යෙදී ධනවතුන් වූ අය නිසා නගරයේ "හොඳ පාසල්වලට" සිසුන් ඇතුළත් කිරීමේ ගැටළුව උග්‍ර වී ඇත. ගුරුවරුන් හා සිසුන්

සම්බන්ධවද මැණික් කර්මාන්තය නිසා ගැටළු රැසක් පැන නැගී ඇති අතර, ශිෂ්‍ය ආකල්ප වලද වෙනස්කම් සිදුවී තිබේ. ක්‍රීඩා උත්සව ආදිය සඳහා මැණික් කර්මාන්තකරුවන් ආධාර කර ඇතත්, ඉන් පාසල්වල ක්‍රීඩා අංශයේ ගුණාත්මක වෙනසක් සිදු වී නැත.

මෙම අධ්‍යයනයේ පළමුවන පරිච්ඡේදයෙන් අධ්‍යාපනය හා පරිසරය නිර්වචනය කෙරෙමින්, අධ්‍යාපනය කෙරේ පරිසරයේ බලපෑම ඇතිවන අයුරු පිළිබඳව විමසා බලන අතර, මේ ක්ෂේත්‍රය ඇසුරින් කෙරී ඇති පර්යේෂණ සාහිත්‍යය පිළිබඳවද අවධානය යොමු කරයි. දෙවන පරිච්ඡේදයෙන් මැණික් හා සම්බන්ධ ඓතිහාසික තොරතුරු රත්නපුර දිස්ත්‍රික්කයේ ඉපැරණි බවත් විමසමින්, මැණික් පිළිබඳ නිර්වචනය හා මැණික්වල ආර්ථික වටිනාකමත්, ශ්‍රී ලංකාව කෙරේ එහි ආර්ථික අගය බලපාන ආකාරයත්, විධිමත් අධ්‍යාපන පද්ධතිය (පාසල්) මැණික් කර්මාන්තය කෙරේ සම්බන්ධ වී ඇති ආකාරයත් විමසා බලයි.

තුන්වන පරිච්ඡේදයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ විධිමත් අධ්‍යාපන පද්ධතිය විසිරී ඇති ආකාරය හා දිස්ත්‍රික්කය පුරා බලපාන අධ්‍යාපන ගැටළු ද විග්‍රහ කරන අතර, නියැදිකරණ ක්‍රමය හා මෙම විස්තරාත්මක පර්යේෂණ පිරියැලසුමත් එහි සීමාවනුත් විග්‍රහ කෙරේයි. හතරවන පරිච්ඡේදයෙන් අධ්‍යයනය මගින් සොයාගනු ලැබූ දත්තයන් විග්‍රහ කෙරෙන අතර, මැණික් කර්මාන්තය විධිමත් අධ්‍යාපන පද්ධතිය කෙරේ බලපා ඇති අයුරුත්, ගුරුභවතුන්, දෙමාපියන් හා ශිෂ්‍යයන්, අධ්‍යාපනය හා මැණික් කර්මාන්තය පිළිබඳව දක්වන අදහස් හා අනාගත අපේක්ෂාවනුත්, සිසුන් මැණික් කර්මාන්තය කෙරේ පෙළඹවීමට බලපා ඇති සාධකයනුත්, මැණික් කර්මාන්තය විධිමත් අධ්‍යාපනයේ ගුණාත්මක බව හා ප්‍රමාණාත්මක බව කෙරේ බලපා ඇති අයුරුත් විමසා බලයි.

පස්වන පරිච්ඡේදයෙන් අධ්‍යයනය මගින් සොයාගනු ලැබූ කරුණු ඇසුරින් නිගමනයන් ඉදිරිපත් කරන අතර සමහර ගැටළු විසඳාගැනීම සඳහා ක්‍රියාමාර්ගයන්ද ඉදිරිපත් කරයි. අවසන් වශයෙන් මේ සම්බන්ධව උනන්දුවන පර්යේෂකයන් සඳහා අවධානය යොමු කළ හැකි කරුණු කිපයක්ද ඉදිරිපත් කර තිබේ.